**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
උපදේශක චක්‍රලේඛය2004/පුස/02(අ)(සංශෝධිත 2023)

# පාසල් / විද්‍යාපීඨ පුස්තකාලයන්හි "ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව 2023 ඔක්තෝබර් මාසයට යෙදෙන **ජාතික කියවීමේ මාසයට** සමගාමීව කියවීම් ප්‍රවර්ධනය සඳහා **විශේෂ** වැඩසටහන් සහ **විශේෂ** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන මෙන් සියලුම පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. **"ලෝකය අයිති කියවන්නාට ය"** යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා **ජාතික කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක්** පත් කර ගැනීම සුදුසු වේ. දැනටමත් පත්කරන ලද පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මගින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැකිය.මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීමද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- විදුහල්පති / නියෝජ්‍ය විදුහල්පති - කමිටු සභාපති
- පුස්තකාලයාධිපති/ගුරු පුස්තකාලයාධිලති / පුස්තකාල භාරකරු - කමිටු ලේකම්
- විදුහල්පති විසින් නම්කරනු ලබන වෙනත් ගුරුවරුන් දෙදෙනෙක්
- ගුරු දෙගුරු සංගමයේ සාමාජික මහත්ම මහත්මීන් දෙදෙනෙක්
- ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙක්

## 03. ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- පාසල් / විද්‍යා පීඨ සිසුන් උදෙසා කියවීම සම්බන්ධ විශේෂ ක්‍රියාකාරකම් සිදු කිරීම.
    - නිවැරදි කියවීම් ක්‍රමවේද හඳුන්වාදීම
    - පොතක එළඹුම් හඳුන්වාදීම
    - ඵලදායි හා කාර්යක්ෂම අන්තර්ජාල ගවේෂණය , අධ්‍යාපනික සාධිකාරි තොරතුරු ගවේෂණය සම්බන්ධයෙන් පාඨකයාව දැනුවත් කිරීම.
    - රසවින්දනාත්මක හා විචාරාත්මක ග්‍රන්ථ පරිශීලනය සඳහා පාඨකයාට මග පෙන්වීම.

**ක්‍රියාත්මක කළ හැකි වෙනත් වැඩසටහන්**

- පාසල් / විද්‍යා පීඨ සිසුන්ගේතොරතුරු අවශ්‍යතා සඳහා සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම .
- පුස්තකාලය හා මෙතෙක් සම්බන්ධ වී නොමැති පාසල් / විද්‍යා පීඨ සිසුන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කියවීම් ප්‍රවර්ධන තරග සංවිධානය කිරීම
- පාසලේ / විද්‍යා පීඨයේ හොඳම පාඨකයා තේරීම.
- සෑම ශිෂ්‍යයකුගේම නිවසේ ගෘහ පුස්තකාල ඇති කිරීම සඳහා දිරිමත් කිරීම.
- දරුවන්ගේ රසඥතාවය ඉහළ නැංවීම සඳහා රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කියවීම් ප්‍රවර්ධනය සඳහා ප්‍රදේශයේ අනෙකුත් පුස්තකාල සමඟ සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම හා ඒ සම්බන්ධ නිර්මාණශීලි වැඩසටහන් සංවිධානය කිරීම.
- සිසුන්ගේ නිර්මාණශීලිත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සඟරා, බිත්ති පුවත්පත් එළි දැක්වීම.
- සිසුන්ගේ භාෂා හැකියාව වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සිදු කිරීම. නොමිලයේ හැදෑරීමට හැකි භාෂා පාඨමාලා සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- හරිත පුස්තකාල සංකල්පයට අදාළව සිදුකළ හැකි ක්‍රියාකාරකම් සිදුකිරීම.
- පාසල් / විද්‍යා පීඨ සිසුන් නව නිපැයුම් නිර්මාණ ඉදිරිපත්කිරීමට නව සංකල්ප හා අදහස් ඉදිරිපත් කිරීමට දිරිගැන්වීම සහ ඔවුන් ඇගයීමට කටයුතු කිරීම.
- පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳ විස්තර හා තොරතුරු අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම. ( පාසල්/ විද්‍යාපීඨ මුහුණු පොත හරහා)

## 04. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා (SDG) ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීම මූලික කරගනිමින් වැඩසටහන් සිදු කිරීම.

## 05. අරමුදල්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් යෙදවීම් අවශය වෙනාව අතර පවතින සම්පත් ඇසුරින් සේවාවන් කාර්යක්ෂම හා ඵලදායීව යෙදවීම ප්‍රමාණවත්ය.

## 06. වාර්තාව සකස් කිරීම

- සිදුකරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් (මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර විදුහල්පතිගේ නිර්දේශය සහිතව ***2024 පෙබරවාරි මස 29*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට එවිය යුතුය.

- ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සඳහා ලකුණු ලබාදීමේ දී කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. මුළු ලකුණුවලින් 75% ක් පුස්තකාලය විසින් කරන ලද වෙනත් ප්‍රජා සේවාවන් සම්බන්ධ තොරතුරු සඳහා 25% ක ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

- වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව **ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින්** ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2023 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2024 ජාතික කියවීමේ මාසය ජාතික උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ. ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරනු ලැබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අවසන් වශයෙන් තේරී පත්වන පුස්තකාල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාළ පුස්තකාලය සඳහා හිමිවන සම්මාන කවරේද යන්න තීරණය කරනු ලැබේ.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07

මහාචාර්ය නන්ද ධර්මරත්න

සභාපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

විමසීම් - දුරකථන අංකය -0714452620 / 0775034455

වෙබ් අඩවිය -www.natlib.lk

# වාර්තාව සකස් කිරීම සඳහා සකසන ලද ආදර්ශ පත්‍රිකාව

| | | |
|---|---|---|
| ඉදිරිපස කවරය සකස් කිරීම | - | ජාතික කියවීමේ මාසය 2023<br>වාර්තාව ඉදිරිපත් කරන පුස්තකාලයේ නම |
| ඇතුලත මුල්පිටුව | - | ලිපිනය, පුස්තකාලය හා සම්බන්ධ විය හැකි අනෙකුත් මාර්ග<br>( දුරකථන අංක,විද්‍යුත් ලිපිනය,වෙබ් පිටුව) |
| පටුන | (1) | ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සිදුකරන ලද විශේෂ වැඩසටහන්.<br>පුස්තකාලය විසින් සංවිධානය කරන ලද වෙනත් වැඩසටහන් |
| | (2) | ඇමුණුම |

ඉහත වැඩසටහන් සඳහා සහභාගීවූවන් - අත්සන් ලේඛන පිටපත්
(සහතික කරන ලද පළමු පිටුව හා අවසන් පිටුව ප්‍රමාණවත්ය.)
වැඩසටහන් අතරතුර ලබාගත් ඡායාරූප

වැඩසටහන් සම්බන්ධ සහතික, ප්‍රචාරණ පත්‍රිකා, පුවත්පත් දැන්වීම් ආදිය මේ යටතේ ඇතුළත් කරන්න.

- ❖ මාතෘකා පිටුව, සහ යොමු කිරීම් පමණක් වෙනම පිටුවකින් ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, එක් එක් කොටසෙහි ආරම්භය නව පිටුවකින් ආරම්භ කිරීම සුදුසු වේ.
- ❖ ඡායාරූප ඇතුළුව සියලුම පිටු අනුපිළිවෙළින් අංකනය කළ යුතුය.
- ❖ අනවශ්‍ය විසිතුරු ඉදිරිපත් කිරීම් සිදු නොකළ යුතුය.